සකස් කිරීම : ධනුෂ්ක සෙනවිරත්න.
කෑ/මාව/ගබ්බල සිරිසඟබෝ ම.වි. (මාවනැල්ල කලාපය)

# නරි බෑණා නාට්‍යයේ ගීත රංගනය සමඟ ගායනා කරමු

පහත දැක්වෙන්නේ නරි බෑණා නාට්‍යයේ ඔබ සිත්ගත් ජවනිකාවක පිටපතේ කොටසකි. මෙහි ඇති දෙබස් උච්චාරණය කිරීමට, රංගනයට හා ගායනා කිරීමට හුරුවන්න.වරහන් තුළ සඳහන් කර ඇත්තේ "රංග විධාන" වේ. නළුවා රඟපෑ යුතු ආකාරය විස්තර කර ඇත්තේ රංග විධාන ඔස්සේ ය.

නරියා:- වා........... ගම දෝණි නම් හරි පංකාදුයි. මෙහෙමත් ලස්සන මනුස්ස දුවක් මං නම් දැකලා නෑ මේ කපේදී. අංග පුලාව හරියට වාත්තු කළා වගේ. හරියට උදේ පිපුණ ඇහැළ මල් පොකුරක් වගේ, ලස්සන. අනේ පිනක් නැනේ මෙහෙම කෙනෙක් ගෙදර ඇත්තෝ කරගන්න. ඇත්තට හනේ මොනවා කරන්නද පූරුවෙ පවක් හින්දා තිරිසන් ආත්මෙ ලැබුවෙ.

(මේ අතර ගම දුව ගී ගයමින් නටයි)

ඇහැළ මලින් ගස් පිරිලා

බලන්න හරි ලස්සනයි

අඹ රඹුටන් ජම්බු ඉදිල

අද හැමතැන හරි හැඩයි

දොඹ ගස් යට මල් හැලිලා

සුවඳක් හැමතැන දැනෙයි

වලි කුකුළන් හඬලනකොට

අහන් ඉන්න හරි හිතයි

ගස්වල දළු සෙලවෙනකොට

ඇඟට හරිම සීතලයි

ඉගිලෙන අර සමනලයින්

අල්ලන්නට බැරි හැඩයි

ගම මහගෙ : දුවේ............දුවේ.......... උඹ කොහේද?

ගම දුව : මං මෙහේ ඇහැළ මල් කඩනෝ

ගම මහගෙ : හනේ,හනේ කෝ දර කැඩුවද...............

බලාපල්ලකො මේකිගෙ සුරල්. එක දර කෑල්ලක් කඩල නැනෙ.

මොනව ද තෝ මෙච්චර වෙලා කොළේ......... තොට නං මිනිහෙක් එක්ක දීග කන්න යන්න හම්බ වෙන්නෙ නෑ. තෝව නම් මනුස්සයෙක් ගෙනියන්නෙ නෑ, තෝව හොඳ නරියෙකුට..... තෝව නං දැන ගං දීග දෙන්නේ නරියෙකුට. ඒක හොඳට මතක තියාගං ඒකෙ ආයෙ වචන දෙකක් නෑ.

තෝව දෙන්නෙත් නරියටයි

තෝව ගන්නෙත් නරියෙකුයි

තෝව දෙන්නෙත් තෝව ගන්නෙත්

කැලේ ඉන්නා නරියෙකුයි.

(ගම මහගේ සහ ගම දුව පිටවේ. ඔවුන් පිට වූ විගස නරියා පඳුර තුළින් එළියට පැන ප්‍රීතියෙන් නටයි.)

**පුහුණුවට:-**

**ඔබගේ සිංහල පෙළපොතේ නරිබෑණා නාට්‍යයේ තවත් සිත්ගත් ජවනිකාවක් ඇත. එම පිටපතේ ඇති දෙබස් උච්චාරණය කිරීමට හුරුවන්න. සිත් ගත් අවස්තාවක් පුහුණුවී රංගනයේ යෙදෙන්න.**

ක්‍රියාකාරකම් :- මෙම සබැඳිය ඔස්සේ https://en.wikipedia.org/wiki/Dayananda_Gunawardena

ගොස් දයානන්ද ගුණවර්ධන මහතාගේ ජීව දත්ත පත්‍රිකාවක් සකසනන.

ඊ තක්සලාව (ඇහැළ මලින්):- https://youtu.be/TeVyHNBjA2o

නිල වෙබ් අඩවිය :- https://www.naribena.com/

නරි බෑණා නාට්‍යයේ ජවනිකා :- https://youtu.be/N2dFNdnJSyM

https://youtu.be/DrdIyotwasE